VERITÉ
විදසුන්

Originally Published in: [?, , ]

## ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ තරගකාරිත්වය

ඕනෑම කෂේත්‍රයක ඇතිවන තරගකාරිත්වයට පදනම වනුයේ වෙනත් අය පරයමින් නැගී සිටීම වේ. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය ගත් කළ ශ්‍රී ලංකාව වැඩි වශයෙන් නැඹුරුතාවයක් දැක්විය යුතු වනුයේ ලෝකය අභිබවා යාමට නොව කලාපය තුළ ඉදිරියෙන් සිටීම පිණිස වේ.

## සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය

යුද්ධය නිම වීමත් සමග ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ඉතා සීග්‍රයෙන් වර්ධනය වූ නමුදු අදාළ ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වයට බලපාන සාධක වල යම් යම් මූලික වැඩි දියුණු කිරීම් සිදු නොකරන්නේ නම් එහි වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගත ගෙන යාමට නොහැක.

මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 2010 වෂර්ය තුළ 50% කින් වැඩි වූ අතර එය 654,000 ක සංඛ්‍යාත්මක අගයකි. 2013 වෂර්ය වන විට එම සංඛ්‍යාව දෙගුණයකට ආසන්න වෙමින් සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 1.27 දක්වා ඉහළ ගියේය. මෙය 2010 වෂර්යේ සිට වාෂරීකව සිදු වූ 25% ක වර්ධන අනුපාතයකි. රජයේ අපේක්ෂාව වනුයේ 2016 වන විට මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 2.5 දක්වා අගයකට ලගා කර ගැනීම වන අතර මෙයින් අරුත් ගන්වනුයේ සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධන වේගය අඛන්ඩව 25% අනුපාතිකයක පවත්වා ගැනීම වේ. නමුත් 2014 දී සංචාරකයන්ගේ ආගමනයට අදාළ වර්ධන වේගය 20% කටත් වඩා පහළ බැස තිබූ අතර එම දුවර්ලතා සැලකිල්ලට නොගන්නේ නම් වර්ධන වේගය තවත් පහල බැසීමට ඉඩ තිබේ.

## සංචාරක ක්ෂේත්‍රයේ තරගකාරිත්ව දශර්ක

මෙම විශ්ලේෂණය මගින්, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තුළ වර්ධනය වෙමින් පවතින ගැටළුව දෙස වෙනස්ම කෝණයක් ඔස්සේ විමසා බලයි. මෙම විශ්ලේෂණය සිදු කිරීමේදී යොදා ගනුයේ ලෝක ආථරීක සංසදයේ සංචාර සහ සංචාරක ව්‍යාපාරයේ තරගකාරිත්ව දශර්ක (TTCI) වේ. මෙම දශර්කයේ කායර්භාරය රටක සංවර්ධනයට සහ තරගකාරිත්වයට දායකත්වය සපයන සංචාර සහ සංචාරක ක්ෂේත්‍රයේ තිරසාර දියුණුවක් ලබාගත හැකි සාධක සහ ප්‍රතිපත්ති, යම් යම් ආථරීක ක්‍රම මගින් කුමන පරාසයක් දක්වා ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳව විනිශ්චය කිරීමයි.

TTCI මගින් ආථරීකයන් 141ක් සඳහා සංචාර සහ සංචාරක ව්‍යාපාරයේ මිනුම් දඬු ද්විවාෂරීකව ප්‍රසිද්ධියට පත් කෙරේ. මෙහිදී පෙන්නුම් කරන සුභදායක පණිවිඩය වනුයේ ශ්‍රී ලංකාවට හිමි තිබූ ස්ථානය, 2014 දී සිත් ගන්නා සුළු වර්ධනයක් අත් කර ගෙන ඇති බැව් වේ. එහිදී 2009 සිට 2013 තෙක් 78 ස්ථානයේ සිට 74 දක්වා ශ්‍රී ලංකාව මන්දගාමීව ඉදිරියට පැමිණි නමුදු, 2015 වන විට සීග්‍ර පියවර 11ක් ඉදියට පැමිණ 63 ස්ථානය හිමි කර ගැනීමට සමත් විය. මෙය පසුගිය වසර පහක කාල සීමාව තුළ කලාපයේ අනිකුත් තරඟකාරී රටවල් දශර්කයේ තමන් සතු ස්ථානයේ ඇතිකර ගත් කැපී පෙනෙන දියුණුවට අනුව වඩා වැඩි වර්ධනයකි.

එනමුදු කලාපය තුළ ශ්‍රී ලංකාව තරමක් පසුගාමී බවක් පෙන්නුම් කිරීම එතරම් හිතකර කරුණක් නොවේ. දශර්ක 14කින් 6ක් සඳහාම ශ්‍රී ලංකාව අවසාන 50 % තුළ ස්ථානගතව ඇති අතර කිසිදු දශර්කයක් සඳහා ඉහල 25% තුළට ඇතුළත් වී නොමැත. (1 රූප සටහන බලන්න).

1 රූප සටහන: ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය කලාපිය සහ ගෝලීය වශයෙන් (ප්‍රතිශතක ස්ථානය)

| සංචාර සහ සංචාරක ව්‍යාපාරයේ තරගකාරිත්ව දශර්ක | කලාපීය තරඟකාරීත්වය | ගෝලීය තරඟකාරීත්වය |
|---|---|---|
| | ආසියානු පැසිෆික් කලාපයේ රටවල් 23ක් අතරින් ප්‍රතිශතක ස්ථානය | ලෝකයේ රටවල් 141ක් අතරින් ප්‍රතිශතක ස්ථානය |
| **බලාත්මක පරිසරය** | | |
| ව්‍යාපාරික පරිසරය | 61 | 63 |
| ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය | 61 | 62 |
| සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව | 57 | 50 |
| තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණයට (ICT) අනුගත වීම | 39 | 35 |
| මානව සම්පත් සහ ශ්‍රම වෙළඳපොළ | 26 | 39 |
| **T සහ T ප්‍රතිපත්තිය සහ බලාත්මක කොන්දේසි** | | |
| සංචාරක ව්‍යාපාරයට ප්‍රමුඛත්වය ලබාදීම | 70 | 79 |
| පාරිසරික තිරසාරත්වය | 61 | 27 |
| ජාත්‍යන්තර විවෘතභාවය | 43 | 54 |
| මිල තරගකාරිත්වය | 35 | 52 |
| **යටිතල පහසුකම්** | | |
| වාරය සහ භූමි යටිතල පහසුකම් | 70 | 71 |
| සංචාරක සේවා යටිතල පහසුකම් | 70 | 48 |
| ගුවන් ප්‍රවාහන යටිතල පහසුකම් | 30 | 50 |
| **ස්වභාවික සහ සංස්කෘතික සම්පත්** | | |
| ස්වභාවික සම්පත් | 57 | 75 |
| සංස්කෘතික සම්පත් සහ ව්‍යාපාරික සංචාර | 26 | 51 |

## පියවර දෙකකින් සවිමත් තීරණ ගැනීම සහ ආදේශ කිරීම


සංචාරක ව්‍යාපාරය හා සබැඳි තීරණ පියවර දෙකක ප්‍රවේශයක පිහිටුවාලිය හැක. පළමුව කලාපය තීරණය කරනු ලැබීමත් පසුව අදාළ කලාපය තුළ ගමනාන්තය තීරණය කිරීමත් වශයෙනි. කලාපය තීරණය කිරීමෙන් අනතුරුව සංචාරකයෙකුට පහසුවෙන් තම ගමනාන්තය සඳහා වෙනත් ආදේශක ලබාගත හැකි අතර ලෝකයේ අනිකුත් ප්‍රදේශ වල පිහිටි රටවලට වඩා ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ භූගෝලීය වශයෙන් ආකෂර්ණීය ස්ථාන, කලාපයේ අනිකුත් රටවල් අභිබවා යන කදිම ආදේශකයක් විය හැකිය. එබැවින් කලාපය තුළ රටවල් වෙන් වශයෙන් හඳුනාගැනීම සහ එකිනෙකා අතර තරඟකාරීත්වය අතිශයින් වැදගත් වේ. සංචාරක ව්‍යාපාරය පැත්තෙන් ගත්කළ කලාපයේ අනිකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ බෙහෙවින්ම දුවර්ල පැති 1 රූපසටහන මගින් හඳුනාගත හැක වේ.

ගෝලීය තරඟකාරීත්වයට වඩා වැඩි කලාපීය තරඟකාරීත්වය හමුවේ ඇති අභියෝග පිලිබඳ අවබෝධ කර ගැනීම පිණිස 2 රූපසටහන උපකාරී වනු ඇත. ශ්‍රී ලංකාව තුළ ගෝලීය තරඟකාරීත්වයට වඩා වැඩි කලාපීය තරඟයක් පවතින ස්ථාන දැකිය හැක්කේ දෙයංශයක පමණි. ඒවා නම් ‘සංචාරක සේවා යටිතල පහසුකම්’ සහ ‘පාරිසරික තිරසාරත්වය’ යනුවෙනි. ශ්‍රී ලංකාව තුළ කලාපීය තරඟකාරීත්වය ගෝලීය වශයෙන් වඩා අඩුවන පැති තුනක් තිබේ: ‘ව්‍යාපාර සහ සංස්කෘතික සම්පත්’, ‘මිල තරගකාරිත්වය’ සහ ‘ජාත්‍යන්තර විවෘතභාවය’ යනුවෙන් වේ.

සංචාර සහ සංචාරක ව්‍යාපාරයේ තරගකාරිත්ව දශර්කයේ ශ්‍රී ලංකාවට හිමි වී ඇති ස්ථානය ඉදිරියට රැගෙන ඒමේ විසඳුම් ක්‍රියාවට නැංවීම තුළින් වේගවත් ප්‍රගතියක් අත්කර ගත හැකිවේ. කලාපීය තරඟකාරීත්වයේ සහ කලාපය තුළ

හිමිව ඇති ආකෂර්ණීය බව වැඩිදියුණු කර ගැනීම තුළින් සංචාරක කමර්ාන්තයේ වධර්නය පිණිස අවධානයට ලක්විය යුතු අංශ හඳුනාගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව මෙම විදශර්නාව තීරුව මගින් මතුකර දක්වා ඇත.

2 රූපසටහන : ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ කලාපීය සහ ගෝලීය තරඟකාරිත්වය




මූලාශ්‍රය : ලෝක ආර්ථික සංසදය මගින් ප්‍රසිද්ධියට පත්කළ TTI දත්ත පදනම් කරගත් වෙරිටේ රිසර්ච් (Verité Research) ගණනය කිරීම්

වෙරිටේ රිසර්ච් (Verité Research) ආයතනය මගින් ආසියානු කලාපයේ රාජ්‍ය සහ පෞද්ගලික අංශවලට උපායමාගර්ික විශ්ලේෂණ සහ උපදෙස් සපයනු ලබයි.

ඔබේ අදහස් සහ යෝජනා අප වෙත යොමු කරන්න : publications@veriteresearch.org